Sri Lanka Tourism
**Sri Lanka Tourism Development Authority, 80, Galle Road, Colombo 03, Sri Lanka.**
Hotline: 1912 Tel: +94 11 2426800/900, Fax: +94 11 2437953 E-mail: info@srilanka.travel, Web: www.srilanka.travel / www.sltda.gov.lk

**මගේ අංකය : SLTDA /SQA /COVID /RP**

2021 දෙසැම්බර් 14

සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක සේවා සපයන ආයතන හා පුද්ගලයන් වෙත,

මහත්මයාණෙනි/ මහත්මියණි,

**සංචාරක ව්‍යාපාර සඳහා ණය හා ලීසිං සහන ලබා ගැනීම සම්බන්ධව.**

සංචාරක ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා සහන පැකේජය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ගරු සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා හා මහා බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සමඟ 2021.11.21 දින පැවතී සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

01. සංචාරක ක්ෂේත්‍රයේ නියුක්ත වූවන් ලබා ගෙන ඇති ණය ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. ඒ අනුව ණය හිමියන්ගේ ඉල්ලීමක් සහිත යෝජනාවක් අදාල බැංකුවට ඉදිරිපත් කොට එය ලබා ගැනීමටත්, එම ණයහිමියන්ට අවශ්‍ය වුවහොත් මහා බැංකුව මගින් නිර්දේශයක් ලබා ගැනීමටත් හැකියාව ඇත.
02. ලීසිං සමාගම් විසින් වාහන අත්පත් කර ගැනීම හා වාරිකයට අමතර මුදලක් එකතු කිරීම ද නවතා ඇත.
03. ලීසිං ක්‍රමයට වාහන ලබාගත් පුද්ගලයන් හට, එම ලීසිං පහසුකම් ගත් ආයතන සමග සාකච්ඡාකොට ඉන්පසු එම ආයතනය මගින් අදාළ සහන ලබා නොදුනහොත්, **"අධ්‍යක්ෂ, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ජනාධිපති මාවත, කොළඹ 01"** වෙත ලියා දන්වන ලෙසත් උපදෙස් දෙනු ලැබීය.

ඒ අනුව උක්ත සාකච්ඡාවේදී එළැඹි තීරණ ඔබගේ දැන ගැනීම සඳහා උක්ත පරිදි ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමු.

ස්තූතියි.

මෙයට විශ්වාසී,

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.**

පිටපත්: 1. අධ්‍යක්ෂ/ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණ